**ශීර්ෂය 52 - විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ කැබිනට් නොවන අමාත්‍යාංශය**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ කැබිනට් නොවන අමාත්‍යාංශයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ **154**(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ කැබිනට් නොවන අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුලත් සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 02 දින ප්‍රධාන ගණන් දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ කැබිනට් නොවන අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජුලි 17 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වන වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ කැබිනට් නොවන අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමන් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇති වීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීමේන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වංචාවක් ඇති වීමට හේතු වන බැවිනි.
- අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිත භාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමණාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳ ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය හා 38 වන වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට

(ආ) ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මා විසින් කර තිබුණු නිර්දේශයන් ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---

### 1.6.1 මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මූල්‍ය තත්ව ප්‍රකාශයේ දේපල පිරියත හා උපකරණ රු. 2,675,853,653 ක් ලෙස දක්වා තිබූ අතර භාණ්ඩාගාරයේ සිගාස් වැඩසටහන යටතේ එම අගය රු.2,686,430,140ක් වශයෙන් දක්වා තිබුණි. ඒ අනුව රු.10,576,487ක වෙනසක් නිරීක්ෂණය විය. | මූල්‍ය ප්‍රකාශන මඟින් වත්කම් වල අගය නිවැරදිව දැක්විය යුතු වීම. | 2019 වර්ෂය තුල විකුණන ලද හා වෙනත් අමාත්‍යාංශ වෙත මාරුකරන ලද වත්කම් වල පිරිවැය වන රු. 10,576,487 ක වටිනාකම New CIGAS පරිගණක වැඩසටහන හරහා 2019 දෙසැම්බර් 31 දිනට හර කිරීමට නොහැකි විය. නමුත් එම වටිනාකමෙන් රු. 1,186,487 ක් වත්කම් 2020 වර්ෂය තුල CIGAS වැඩසටහන යටතේ හර කිරීමට කටයුතු කර ඇති අතර ඉතිරිය කඩිනමින් CIGAS වැඩසටහනට ඇතුලත් කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |
| (ආ) | වත්කම් විකිණීමෙන් ලද රු. 1,186,487ක මුදල භාණ්ඩාගාරයේ සිගාස් වැඩසටහන යටතේ පෙන්නුම්කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන මඟින් වත්කම් වල අගය නිවැරදිව දැක්විය යුතු වීම. | - එම - |
| (ඇ) | අමාත්‍යාංශය යටතේ පවතින විදාතා මධ්‍යස්ථාන 267 ක් සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහාද මිලදී ගැනීම් සිදුකරන අතර වර්ෂය තුළ එසේ මිලදී ගත් රු. 2,372,847 ක දේපල, පිරියත හා උපකරණ හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබූ අතර පෙර වර්ෂවලට අයත් දේපල, පිරියත හා උපකරණද හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන මඟින් වත්කම් වල අගය නිවැරදිව දැක්විය යුතු වීම. | සියලුම විදාතා සම්පත් මධ්‍යස්ථාන වලට අදාල උපකරණ මිලදී ගනු ලබන්නේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා වේ. ගඅදාල ලිපි ලේඛන ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් නඩත්තුකරන අතර එම උපකරණ විදාතා සම්පත් මධ්‍යස්ථාන වෙත ලබාදුන් පසු ඉන්වෙන්ට්‍රිගත කරනු ලැබේ. මේ වන විට 2018/2019 වර්ෂ වලට අදාලව මිලදී ගන්නා ලද උපකරණ පිළිබඳ විස්තර අමාත්‍යාංශය වෙත ගෙන්වා ගෙන එම වත්කම් New CIGAS පරිගණක වැඩසටහන හරහා ගිණුම්ගත කිරීමට කටයුතු කරමින් පවතී. |

### 1.6.2 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 891(1) සඳහන් තොරතුරු ඇතුළත් වන පරිදි ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනයක් පවත්වා ගත යුතු වීම. | මුදල් රෙගුලාසි 880 හා ඇප ආඥාපනත ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් හඳුනාගෙන ඇප තැන්පත් කිරීමට අවශ්‍ය කටයුතු ඉදිරියේදී සිදුකිරීමට අවශ්‍ය උපදෙස් ලබා දීමට කටයුතු කල බව කාරුණිකව දන්වා සිටිමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මුදල් රෙගුලාසි 50 (II) ප්‍රකාරව ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණයෙන් නිවැරදිව පිළියෙල කිරීම ප්‍රධාන ගණන් දීමේ නිලධාරියාගේ වගකීම වුවත් ඒ අනුව කටයුතු කර නොතිබූ නිසා වැය විෂයයන් 11 ක් සඳහා ලබා දී තිබුණු රු.320,000,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදි වියදම් ඇස්තමේන්තු පිළියෙල කල යුතු වීම. | විශේෂ ව්‍යාපෘති අමාත්‍යාංශයේ වත්කම් මෙම අමාත්‍යාංශයට පවරා ගැනීමත් සමඟ ඇති වූ වත්කම් අතිරික්ත වීමත්, ප්‍රසම්පාදන කටයුතු සීමා වීමත්, ප්‍රසම්පාදන කටයුතු සිදු කල නමුදු අවශ්‍යතාවයට සරිලන ගොඩනැගිල්ලක් නොමැති වීමත්, ජාතික අයවැය චක්‍රලේඛ අංක 5/2019 ප්‍රකාර වියදම් සීමා කිරීමත්, ප්‍රතිපාදන ඉතිරි වීමට හේතු විය. |

## 2.2 තැන්පත් ශේෂයන්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වර්ෂ 02 ක කාලයක් ඉක්මවූ එකතුව රු. 1,995,988 ක් වටිනා තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කල යුතු වීම. | මෙය STS Forum සඳහා ලද මුදලක් වන අතර මෙම මුදල ගෙවීමට කටයුතු සඳහා අවශ්‍ය කමිටු තීරණ ගනිමින් පවතී. ඒ අනුව කඩිනමින් මෙම මුදල ගෙවා අවසන් කිරීමට කටයුතු කරමින් පවතී. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 සැලැසුම් කිරීම

2014 පෙබරවාරි 17 දිනැති අංක 2014/01 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කාර්යසාධනය සම්බන්ධ සැලැසුම් කිරීම පිළිබඳ අනාවරණය වූ ඌනතාවයන් පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) සමාලෝචිත වර්ෂයට අදාල වාර්ෂික අයවැය පදනම් කරගත් ප්‍රමුඛතා අනුව සකස් කල ක්‍රියාකාරකම් සැලසුම් වල (Activity plan) ක්‍රියාත්මක කාල රාමුව (Time line) හා එම ක්‍රියාකාරකම් වල අපේක්ෂිත නිමවුම් ප්‍රතිඵල (Out put) ඇස්තමේන්තු කර ඒවා සඳහන් කර නොතිබුණි. | 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කලයුතු කාල රාමු, එම ක්‍රියාකාරකම්වල අපේක්ෂිත නිමැවුම් හා ප්‍රතිඵල ඇස්තමේන්තු කර සඳහන් කල යුතු වීම. | අදාල වර්ෂය තුළ වාර්ෂික අයවැය පදනම් කරගත් ප්‍රමුඛතා අනුව සකස් කල ක්‍රියාකාරකම්, ක්‍රියාත්මක කාල රාමුව සහ ප්‍රධාන කාර්ය සාධන දර්ශකය/ නිමැවුම් දර්ශක ඇතුලත්ව ක්‍රියාත්මක සැලැස්ම සකස් කොට ඇත. ප්‍රමුඛතාවය මත ව්‍යාපෘති හඳුනා ගනු ලැබූ අතර 2019 වසරට ලැබූ ප්‍රතිපාදන පදනම් කොට ගෙන තෝරා ගනු ලැබූ ප්‍රමුඛ ව්‍යාපෘතිවලට අදාලව ඉහත කරුණුවලට අදාලව සකස් කොට ඇත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචන වර්ෂයේ යාවත්කාලීන කල ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත කාර්ය මණ්ඩලය සහ දැනට සේවයේ යෙදී සිටින කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර හා අභ්‍යන්තර විගණන සැලැස්ම ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කර නොතිබුණි. | 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව සංවිධාන ව්‍යුහය, අනුමත කාර්ය මණ්ඩලය හා තත්‍ය කාර්ය මණ්ඩලය හා අභ්‍යන්තර විගණන සැලැස්ම විගණනයට ඉදිරිපත් කල යුතු වීම. | 2019 වර්ෂය සඳහා වන ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේදී අනුමත කාර්යය මණ්ඩලය හා දැනට සේවයේ නියුතු කාර්යය මණ්ඩලය පිළිබඳ විස්තර ඇතුලත් කර නොමැත. නමුත් ඉදිරි වර්ෂ සඳහා ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීමේදී 1/2014 චක්‍රලේඛ උපදෙස් පරිදි සකස් කිරීමට සටහන තබා ගන්නා ලදී |

**3.2 කාර්යභාරයන් ඉටු නොකිරීම**

අමාත්‍යාංශය විසින් ඉටු කළ යුතුව තිබුණු කාර්යභාරයන් ඉටු නොකිරීම පිළිබඳ නිරීක්ෂණ පහත සඳහන් පරිදි විය.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ජාතික විද්‍යා මධ්‍යස්ථානයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට 2019 වර්ෂයේ සැලසුම් කර තිබුණ ද ඉඩම මිලදී ගැනීමේ කටයුතු පමණක් අවසන් කර තිබුණි. | සැලසුම් කළ කාර්ය භාරය ඉටු කිරීමට අවශ්‍ය වන අනෙකුත් සැලසුම් හා කාල රාමුව නිවැරදිව සැලසුම් කල යුතු බව හා එකී සැලසුම් අනුව කටයුතු කල යුතු වීම. | අදහස් දක්වා නැත. |
| (ආ) | කලාපීය වශයෙන් සූර්ය පැනල මූලාකෘති නිෂ්පාදන ව්‍යාපෘතියේ අධ්‍යාන වැඩ සටහනක් ගුරුවරු 100 කගේ සහභාගීත්වයෙන් පැවැත්වීමට සැලසුම්කර තිබුණද එම වැඩසටහන පවත්වා නොතිබුණි. මේ සඳහා රු.400,000 ක් වෙන්කර තිබුණද මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි. මේ සම්බන්ධයෙන් ගුරුවරුන් 38 දෙනෙකු සම්බන්ධ කරගෙන දැනුවත් කිරීමේ වැඩසටහනක් පමණක් 2019 නොවැම්බර් 04 දින පවත්වා තිබුණි. | සැලසුම් කළ කාර්ය භාරය ඉටු කිරීමට අවශ්‍ය වන අනෙකුත් සැලසුම් හා කාල රාමුව නිවැරදිව සැලසුම් කර ක්‍රියාත්මක කලයුතු වීම. | ආරම්භයක් ලෙස, 2019 නොවැම්බර් 4 වන දින ගුරුවරුන් 38 දෙනෙකු සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ (MoE) සහයෝගයෙන් ගුරුවරුන් දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී. මෙම වැඩසටහන වැඩි දියුණු කිරීමට සාකච්ඡා කෙරෙමින් පවතී. මේ වන විට මෙම වැඩසටහන සඳහා වන විෂය මාලාව සමාලෝචනය කරමින් පවතින අතර ලබන වසර මුලදී මෙම වැඩසටහන ආරම්භ කිරීමට අපේක්ෂා කෙරේ. |

## 3.3 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) කාර්මික තාක්ෂණ ආයතනය මඟින් පෙට්‍රෝලියම් නිෂ්පාදන පරීක්ෂා කිරීම සඳහා පහසුකම් ස්ථාපන ව්‍යාපෘතිය වෙනුවෙන් රු.මිලියන 70 ක් වැයකර තිබුණ ද එම පරීක්ෂණ කටයුතු වර්තමානය වන විටද ආරම්භ කර නොතිබුණි. | වැයකරන ලද මුදලට උපරිම ප්‍රතිලාභයක් ලබා ගැනිමට කටයුතු කළ යුතු වීම. | අදහස් දක්වා නැත. |
| (ආ) විද්‍යාත්මක පුහුණු වැඩසටහන් යටතේ Talent young scientific program indian scientific and research fellowshop වැඩසටහන සඳහා රු.මිලියනයක් වෙන් කර තිබුණි. මේ සඳහා පුවත්පත් දැන්වීමක් පලකර තිබූ අතර අයදුම්පත් කිසිවක් ලැබී නොතිබුණු නිසා ඒ වෙනුවෙන් දරන ලද රු.27,140 ක් වූ මුදල නිශ්ඵල වියදමක් වී තිබුණි. අමාත්‍යාංශය ඉදිරිපත් කරන ලද පිළිතුර අනුව අයදුම්පත් 07ක් ලැබී ඇති බව දක්වා තිබුණද එය සනාථ කිරීම සඳහා කිසිදු සාක්ෂියක් විගණනයට ඉදිරිපත් කිරීමට අමාත්‍යාංශය අපොහොසත් විය. | සැලසුම් කළ කාර්ය භාරය ඉටු කිරීමට අවශ්‍ය වන අනෙකුත් සැලසුම් හා කාල රාමුව නිවැරදිව නිශ්චය කල යුතු වීම . | TYSF/ISRF වැඩසටහන සඳහා පුවත්පත් දැන්වීම් 2019 ජනවාරි 23 දිනයේ දී පලකල අතර ඒ සඳහා අයදුම්පත් 07 ක් අමාත්‍යාංශය වෙත ලැබුනු නමුදු මූලික සුදුසුකම් සපුරා නොමැති බැවින් චීනය හෝ ඉන්දියාව සමඟ විද්‍යාත්මක පර්යේෂණ හුවමාරු වැඩසටහන සඳහා එකම අයදුම්පතක් හෝ ඉදිරිපත් කිරීමට නොහැකි විය. |

## 3.4 ප්‍රසම්පාදනයන්

------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ග්‍රහලෝකාගාරයට ප්‍රක්ශේපන බල්බ් 2 ක් මිලදී ගැනීමට රු.1,950,000 ක මුදලක් ඇස්තමේන්තු කර තිබූ නමුත් 2019 වර්ෂය තුලදී රු.3,049,800 ක මුදලකට බල්බ් 04 මිලදී ගෙන තිබුණි. 2018 ඔක්තෝබර් 17 දින ටෙන්ඩර් ඇගයීම් කමිටු රැස්වීමේදී බල්බ් 04 මිලදී ගැනීමට ප්‍රොජෙක්ටරය සැපයූ මච් සමාගමෙන් මිලදීගැනීමට තීරණය කර තිබුණි. තවද, එම ආයතනයෙන් බල්බ් මිලදී ගැනීමට නොහැකි වුවහොත් ජාත්‍යන්තර තරඟකාරී මිල කැඳවීම් ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය කල යුතු බව තාක්ෂණ ඇගයීම් කමිටුව සඳහන් කර තිබුණි. නමුත් ඒ කෙරෙහි අවධානය යොමු නොකර දේශීය ආයතන කීපයකින් මිල ගණන් කැඳවා ප්‍රක්ෂේපිත බල්බ 4 ක් මිලදීගෙන තිබුණි. | ඇල්මක් දක්වන පාර්ශවයන්ට මිල ගණන් ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි කටයුතු කල යුතු වීම. | අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය මත ශ්‍රී ලංකා ටෙලිකොම් රේන්බෝ පිටුවල ලියාපදිංචි බල්බ සැපයුම්කරුවන් 05 දෙනෙකුගෙන් මිල ගණන් කැඳවූ අතර 2019 පෙබරවාරි 28 දින පෙරවරු 11.30 ට මිල ගණන් විවෘත කිරීමේ කමිටුව මගින් මිල විවෘත කරන විට එක් ආයතනයකින් පමණක් මිල ගණන් ඉදිරිපත් කර තිබුණි. ඒ අනුව ප්‍රසම්පාදන ක්‍රියාවලියට අනුගතව අදාල මිල දී ගැනීම සිදුකර ඇති බව කාරුණිකව දැනුම් දෙමි. |
| (ආ) ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 (ආ) වගන්තියට අනුව ලංසුකරු විසින් ඉදිරිපත් කරන ලද ලංසුව ප්‍රතිග්‍රහනය කිරීමෙන් පසු කොන්ත්‍රාත් ගිවිසුමක් අත්සන් කළ යුතු වුවත් රු.3,049,800 ක් වටිනා මිලදී ගැනීම් වෙනුවෙන් ගිවිසුමක් අත්සන් කර නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතු වීම. | විධිමත් ඇණවුමක් මඟින් ඇණවුම් කර ඇති අතර සැපයුම්කරු නිසි පරිදි අදාල භාණ්ඩ ශ්‍රී ලංකා ග්‍රහලෝකාගාරය වෙත සැපයුම්කර ඇති අතර වගකීම් සහතිකයක් ද ලබා දී ඇති බව කාරුණිකව දන්වමි. |
| (ඇ) විද්‍යා තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයට අයත් ශ්‍රී ලංකා ග්‍රහලෝකාගාර කුටියේ ආසන 564 ක් අළුත්වැඩියා කිරීම, පොලිෂ් කිරීම හා කුෂන් කිරීම සඳහා රු.4,519,324 ක මුදලක් පුද්ගලික ආයතනයට ගෙවීම්කර තිබුණි. මෙහිදී ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.1 හා 4.3.2 පරිදි මෙම කාර්ය සඳහා මුළු පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙල කර නොතිබුණි. | ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ සඳහන් විධිවිධාන අනුව කටයුතු කල යුතු වීම. | මේ සම්බන්ධව දළ ඇස්තමේනතුවක් ලෙස රු.4,000,000 මුදලක් වැය වේ යැයි අපේක්ෂා කර ප්‍රසම්පාදන සැලැස්මට ඇතුලත් කර ඇත. ඉදිරියේදී මෙවැනි මඟහැරීම් නිවැරදි කිරීමට කටයුතු යොදනු ලැබේ. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | ශ්‍රී ලංකා ග්‍රහලෝකාගාර කුටියේ පුටු 275 ක් අළුත්වැඩියා කිරීමේදී එක පුටුවක් අළුත්වැඩියා කිරීම සඳහා රු.2,660 ක මුදලක් සැපයුම්කරුට ගෙවීම් කර තිබුණද, සිදුකල යුතු අළුත්වැඩියාවක් පිළිබඳ තොරතුරු ගොනුගත කර නොතිබීම නිසා එම තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීය. | ප්‍රසම්පාදනයට අදාල තොරතුරු සියල්ල ගොනුගත කල යුතු වීම. | අලුත්වැඩියා කිරීමට අදාලව ලංසුකරුවන්ගෙන් බලාපොරොත්තු වන්නේ කවරේද යන්න ලංසු ලියවිල්ලේ පිටු අංක 9 හි පැහැදිලි ලෙස දක්වා තිබුණි. |
| (ඉ) | ශ්‍රී ලංකා ග්‍රහලෝකාගාර කුටියේ පුටු අළුත්වැඩියා කිරීම කුෂන් කිරීම හා පොලිෂ් කිරීමේ කාර්යයේදී ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 (අ) වගන්තියට අනුව ලංසුකරු විසින් ඉදිරිපත් කරන ලද ලංසු වටිනාකම රු.500,000 ක් ඉක්මවා තිබුණද, ඒ සඳහා විධිමත් ගිවිසුමක් අත්සන් කිරීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුව කටයුතු කල යුතු වීම. | 2019 මාර්තු 07 දිනැති ප්‍රසම්පාදන පිරිනැමීමේ ලිපියෙන් අදාල ලංසුකරු වෙත ගිවිසුම් ගතවීමට දන්වා තිබුණද ප්‍රමාද දෝෂයකින් එය සිදු කර නොමැත. |
| (ඊ) | උක්ත කාර්යය වෙනුවෙන් ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.10(ඇ) අනුව තෝරා ගන්නා ලද සැපයුම්කරුවන්ගෙන් කාර්යසාධන සුරක්ෂිතයන් ලබාගත යුතු වුවත් එසේ කටයුතු කර නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුව කටයුතු කල යුතු වීම. | 2019 මාර්තු 07 දිනැති ප්‍රසම්පාදන පිරිනැමීමේ ලිපියෙන් කාර්ය සාධන සුරක්ෂණයක් ඉදිරිපත් කරන ලෙස දැනුම් දී තිබුණද ඔහු කාර්ය සාධන සුරක්ෂණය ඉදිරිපත් කර නොතිබුණි. කෙසේ නමුත් නියමිත කාල පරිච්ඡේදය තුල මෙම කාර්යය නියමිත පරිදි ඉටු කර අවසන් කර ඇත. |
| (උ) | උක්ත කාර්යය වෙනුවෙන් ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.6.1 (ආ) ඡේදය ප්‍රකාරව තාක්ෂණික ඇගයීම් කමිටුවට අවශ්‍ය නම් බාහිර උපදේශකවරයෙකුගේ සහාය ලබා ගතහැකි බව දක්වා තිබුණද තාක්ෂණික ඇගයීම් කමිටුවේ අනුදැනුමෙන් තොරව ප්‍රසම්පාදන කාර්යය සැපයුම්කරුට භාරදීමෙන් පසු සාම්පල් පරික්ෂා කිරීමට බාහිර උපදේශවරයෙකු 2019 මාර්තු 26 දින පත්කර ගෙන තිබුණි**.** ඒ අනුව සාම්පල් පරික්ෂා කර බාහිර උපදේශක විසින් සිදුකල වෙනස්කම් සඳහා රු.186,120 ක අතිරේක මුදලක්ද සැපයුම්කරුට ගෙවා තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුව කටයුතු කල යුතු වීම. | තාක්ෂණ ඇගයීම් කමිටු සභාපති විසින් වාචිකව අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව වෙත දන්වා තිබූ පරිදි රෙක්සින් හා අනෙකුත් අංගවල මිල, ගුණාත්මකභාවය පිළිබඳ තාක්ෂණ ඇගයීම් කමිටුව වෙත මනා දැනුමක් නොතිබූ බැවින් අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ තීරණයක් මත රජයේ මුදල් වඩාත් පිරිමැසුම්දායී හා ඵලදායී ලෙස යෙදවීම උදෙසා තාක්ෂණික ඇගයීම් කමිටුවට බාහිර විශේෂඥ දැනුමැති නිලධාරියෙකුගේ සහාය ලබාගැනීමට අනුමැතිය ලබාදී ඇත. ඒ අනුව පත් කරන ලද විශේෂඥ දැනුමැති නිලධාරීගේ 2019 අප්‍රේල් 09 විස්තරාත්මක |

| | | | |
|---|---|---|---|
| | | | වාර්තාව අනුව කලයුතු විශේෂ කාර්යයන් දක්වා ඇති අතර, එම විශේෂ කාර්යයන් සඳහා 2019 අගෝස්තු 08 දිනැති තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශය ලබාදී ඇත. ඒ අනුව මෙම ගෙවීම විශේෂඥ නිලධාරීන්, තාක්ෂණික ඇගයීම් කමිටුවේ හා අමාත්‍යාංශ ලේකම්ගේද අනුමැතියෙන් ඉටුකර ඇති බව කාරුණිකව දන්වමි. |
| (ඌ) | ශ්‍රී ලංකා ග්‍රහලෝකාගාර කුටියේ පුටු අළුත්වැඩියා කිරීම කුෂන් කිරීම හා පොලිෂ් කිරීම වෙනුවෙන් ශ්‍රී ලංකා ටෙලිකොම් දුරකථන නාමාවලියේ දේදුනු පිටුවල වාහන කුෂන් කිරීමේ ආයතන 16 කින් මිල ගණන් කැඳවා තිබුණි. මෙහිදී ආයතන 03 ක් පමණක් මිල ගණන් ඉදිරිපත් කර තිබුණද එම ආයතන 03 හි අයිතිකරු එකම පුද්ගලයෙකු විය. | ප්‍රසම්පාදනයන් සිදුකිරීමේදී අවම පිරිවැයකින් උපරිම ගුණත්වයකින් යුතු සේවාවක් ලබාගැනීමට කටයුතු කල යුතු වීම. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් අනුව ප්‍රස්තුත ලංසුව කැඳවීමේදී රේන්බෝ පිටුවල සඳහන් ආයතන 16 ක් අතරින් මිල ගණන් කැඳවා ඇති බව කාරුණිකව දන්වා සිටිමි. |
| (එ) | ශ්‍රී ලංකා ග්‍රහලෝකාගාරයේ පුටු සකස් කිරීමේ කටයුතු වෙනුවෙන් රජයේ වැඩ දෙපාර්තමේන්තුවෙන් විමසීමක් කර නොතිබුණි. | ප්‍රසම්පාදනයන් සිදුකිරීමේදී අවම පිරිවැයකින් උපරිම ගුණත්වයකින් යුතු සේවාවක් ලබාගැනීමට කටයුතු කල යුතු වීම. | රේන්බෝ පිටුවලින් මිලගණන් කැඳවීම මත රජයේ ආයතනය මගහැරී ඇති බව කාරුණිකව දැනුම් දෙමි. |

**3.5 වත්කම් කළමනාකරණය**

**---------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| -------------------------- | ------------- | ------------------------------------- |
| (අ) මූල්‍ය ප්‍රකාශන දිනය වූ 2020 පෙබරවාරි 28 දිනට භාණ්ඩ සත්‍යාපනය කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන දිනය වූ 2020 පෙබරවාරි 28 දිනට භාණ්ඩ සත්‍යාපනය සිදු කළ යුතු වීම. | විදාතා සම්පත් මධ්‍යස්ථාන 49 ක භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් කර වාර්තා අමාත්‍යාංශය වෙත එවා ඇත. එබැවින් ඉතිරි වාර්තාද කඩිනමින් ගෙන්වා ගෙන භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | විද්‍යා,තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ හිටපු රාජ්‍ය අමාත්‍යවරයාට නිකුත් කරන ලද ලැප්ටොප් පරිගණක 01 ක්, වොෂින් මැෂින් 01 ක් හා ජංගම දුරකථනයනක් ඇතුළු අයිතම් 18 ක් විගණන වාර්තාවේ සඳහන් දිනය තෙක් ආපසු භාරගැනීමට කටයුතු කර නොතිබුණි. | වත්කම් ආපසු පවරා ගැනීමට අදාල කටයුතු නොපමාව කළ යුතු විම. | අදාල භාණ්ඩ විධිමත්ව භාර දීමට කටයුතු කරන ලෙස 2019.12.20, 2019.10.24, 2019.03.14, 2019 පෙබරවාරි 06 දරන ලිපි මඟින් හිටපු රාජ්‍ය අමාත්‍යවරයා ඇනුවත් කර ඇතත් මෙතෙක් කිසිදු පිලිතුරක් ලැබී නැත. |
| (ඇ) | මැද දුම්බර හා පාතදුම්බර විදාතා මධ්‍යස්ථානවල විද්‍යා හා තාක්‍ෂණ නිලධාරී මහතුන් පිළිවෙලින් 2016 දෙසැම්බර් 09 දින හා 2016 නොවැම්බර් 15 දින සිට සේවයට වාර්තා කර නොතිබූ අතර ඔවුන් වෙත නිකුත් කර තිබූ යතුරුපැදිවල වටිනාකම රු. 144,920 ක් බැගින් වූයෙන් එකී මුදල් නැවත අයකර ගැනීමට හෝ යතුරුපැදි නැවත අමාත්‍යාංශය වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ආයතන සංග්‍රහයේ **XXIV**වන පරිච්ඡේදයේ 4 වන වගන්තිය අනුව කටයුතු කළ යුතු වීම. | මැදදුම්බර විදාතා මධ්‍යස්ථානයේ කේ.ජී.ආර්.ධර්මකීර්ති මහතා තනතුර අතහැර යාමේ නිවේදනය නිකුත් කර මාස 03කට පෙර අභියාචනයක් ලබා දීම හේතුවෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස් පරිදි නැවත සේවයේ පිහිටුවීමට හෝ විශ්‍රාම ගැන්වීම සම්බන්ධ කටයුතු සිදුකරමින් පවතින අතර විනය බලධරයා විසින් නැවත සේවයේ පිහිටුවීම හෝ විශ්‍රාම ගැන්වීම ප්‍රතික්ෂේප කළහොත් යතුරුපැදියේ වටිනාකම අයකරගැනීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. පාතදුම්බර මධ්‍යස්ථානයේ නිලධාරියා ලිපි 2 කින් දැනුවත් කර ඇති නමුත් මෙතෙක් ප්‍රතිචාරයක් ලැබී නැත. |

## 3.6 රජයේ නිලධාරීන් ඇප තැබීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව රජයේ මුදල් ආදායම, මුද්දර හෝ බඩු භාරව සිටීම එසේ නැතහොත් බඩු බාහිරාදිය නිකුත් කිරීම සම්බන්ධයෙන් පරිපාලනමය වශයෙන් වගකිව යුතු හෝ බලය පැවරීම යටතේ එම කටයුතු පවරනු ලැබූ ඇති නිලධාරීන් ද රජයේ ගිවිසුම්වලට අදාල වවුචර් සහතික කරන, චෙක්පත් අත්සන් කරන අයද ඇප ආඥා පනතේ 612 වන අධිකාරිය අනුව ඇප තැන්පතු තැබිය යුතු වුවත් එකී කටයුතුවලට සම්බන්ධ අමාත්‍යාංශයේ නිලධාරීන් ඇප තැන්පතු තබා නොතිබුණි. | මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව කටයුතු කල යුතු වීම. | අදහස් දක්වා නැත. |

## 3.7 අවිධිමත් ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ කැබිනට් නොවන අමාත්‍යවරයාගේ ප්‍රයෝජනය සඳහා රු.219,999 ක වටිනා ජංගම දුරකථනයක් මිලදී ගෙන තිබුණු අතර මෙම දුරකථනයේ වගකීම් කාලය තුල අනතුරකට පත් වී තිබුණි.නැවත වරක් එකී ජංගම දුරකතනය මිලදී ගත් ආයතනයෙන්ම අතිරේක රු.127,447 ක මුදලක් ගෙවා නව දුරකථනයක් ලබාගෙන තිබුණි. මෙම රු.127,447 ක මුදල ගෙවූ බවට ඉන්වොයිසියේ මුල් පිටපත විගණනයට ඉදිරිපත් නොවූ අතර ඒ සඳහා වැඩ අංක 0819w0084 අනුව එම ආයතනයෙන් ඇස්තමේන්තුවක් ලබාගෙන එම ඇස්තමේන්තුවට මුදල් ගෙවා තිබුණි.<br>වගකීම් කාලය තුල හානිවීම් සම්බන්ධයෙන් මිලදී ගත් ආයතනයේ | ගෙවීමට අදාල සියලු තොරතුරුවල මුල් පිටපත් විගණනයට ඉදිරිපත් කලයුතු අතර ධූරය අවසන් වීමෙන් පසු භාවිතයට ගන්නා ලද වත්කම් නැවත අමාත්‍යාංශය වෙත භාරදිය යුතු වීම. | උක්ත අලුත්වැඩියාව අබාන්ස් පී.එල්.සී ආයතනයේ කොන්දේසියක් ලෙස මුදල් ගෙවීමෙන් පසු පමණක් සේවාව ඉටුකරන බව දන්වා ඇති බැවින් ඉන්වොයිස් පිටපතක් ලබාගෙන ගෙවීම් කර ඇත. ප්‍රමාද දෝෂයකින් මුල් පිටපත ගොනුගත කිරීමට නොහැකි වී අතර, ඉදිරියේදී එවැනි තත්වයන් සිදුනොවන සේ කටයුතු කිරීමට සටහන් කර ගත් බව කාරුණිකව දන්වා සිටිමි.<br>මේ වනවිට අදාල භාණ්ඩය තොග ලේඛනයට ඇතුලත් කර නිවැරදි කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි.<br>අදාල ජංගම දුරකථන අමාත්‍යාංශය වෙත විධිමත්ව භාරදෙන ලෙස අමාත්‍යතුමාට ලිඛිතව දැනුවත්කර ඇතත් මෙතෙක් අප වෙත භාර දී නොමැත. |

වගකීම පිළිබඳ කිසිදු සාක්ෂියක් නොතිබුණු අතර නව දුරකථනයක් නැවත මිලදී ගැනීම ගැටළු සහගත විය. එසේම තම සේවා කාලය අවසන් වූ වහාම තමා යටතේ ඇති ඉන්වන්ට්‍රි භාණ්ඩ අමාත්‍යාංශයට භාරදිය යුතු වුවත් අමාත්‍යවරයා විසින් එම දුරකථනය ආපසු භාරදී නොතිබුණු අතර මෙය ආපසු ලබා ගැනීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග අමාත්‍යාංශය විසින් ගෙන නොතිබුණි.

## 4. තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| තිරසර සංවර්ධන ඉලක්ක ලඟා කර ගැනීමට සූදානම් වීමේදී අනෙකුත් ආයතන සමඟ මනා සම්බන්ධීකරණයක් නොමැති වීම හේතුවෙන් ඉලක්කගත අරමුණු කරා ලඟා වීමට සැලසුම් සකස් කිරීම හා පෙර සූදානම් වීමේ ක්‍රියාවලිය ඉතා දුර්වල මට්ටමක පැවති බව නිරීක්ෂණය විය. | ඉලක්ක ගත අරමුණු කරා ලඟාවීමට සැලසුම් සකස් කළ යුතු වීම. | තිරසර සංවර්ධන අරමුණු පදනම් කොට ගනිමින් අමාත්‍යාංශයේ සියලු වැඩසටහන් සකස් කර ඇත. නමුත් ඒවා ක්‍රියාත්මක කිරීමේදී ඉලක්කගත අරමුණු ඉටුකරගෙන ඇති ද යන්න ඇගයීමට නිශ්චිත දත්ත පද්ධතියක් නොමැති බව සත්‍යයකි. එය නිසිපරිදි සැකසීම සඳහා මේ වන විට කටයුතු කරමින් පවතී. |

## 5. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය අවසාන වනවිට පැවති පුරප්පාඩු 128 ක් පිරවීමට අමාත්‍යාංශය විසින් කටයුතු කර නොතිබුණි. | අත්‍යවශ්‍ය තනතුරුවලට නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු කළ යුතු වීම. | ඉදිරියේදී එම පුරප්පාඩු සඳහා බඳවා ගැනීම් කරනු ලැබේ. |